ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE

පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்லை
Pelawatta, Battaramulla.

මගේ අංකය / எனது இல / My No: 6/16/AL/ PRAC/2024/G
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2024.11.11

දුරකථන / தொலைபேசி / Telephones: 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206,
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2785220
තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503, කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O.Box 1503 Colombo
අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Internet Address: www.doenets.lk
E-mail : examd@sltnet.lk

සියලු ම විදුහල්පතිවරුන් වෙත,

අ.පො.ස (උ.පෙළ) විභාගය -2024
**ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පරීක්ෂකවරුන් තෝරා ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම**

උක්ත විභාගයේ පහත සඳහන් විෂයයන් උසස් පෙළ පංතිවලට උගන්වනු ලබන ගුරු භවතුන් ප්‍රායෝගික පරීක්ෂණයේ පරීක්ෂකවරුන් වශයෙන් තෝරා ගැනීමට සලකා බැලීම සඳහා පිළියෙල කර ඇති ආකෘති පත්‍රය විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියෙහි (www.doenets.lk) පළ කොට ඇත. මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ එම අයදුම්පත්‍රය සම්පූර්ණ කර එහි මුද්‍රිත පිටපත පාසලේ විදුහල්පති විසින් සහතික කොට 2024.11.30 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතු වේ. මාර්ගගත (online) ක්‍රමය යටතේ අයදුම්පත පියවරෙන් පියවර සම්පූර්ණ කළ යුතු ආකාරය දක්වා ඇති උපදෙස් පත්‍රය මේ සමඟ එවා ඇත. ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම්පත් යොමු කළ හැකි වනුයේ රජයේ හෝ රජයේ අනුමත පෞද්ගලික පාසලක ස්ථිර ගුරුවරයෙකුට පමණි. (ඇමුණුම 01 බලන්න.)

02. පහත විෂයයන්හි පවත්නා පුරප්පාඩු, සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨත්වය පදනම් කර ගෙන පත්වීම් කරනු ලැබේ.

| | |
|---|---|
| 28 - ගෘහ ආර්ථික විද්‍යාව | 52 - නර්තනය (දේශීය) |
| 54 - සංගීතය (පෙරදිග) | 57 - නාට්‍ය හා රංගකලාව (සිංහල) |

2.1 ඉහත විෂයයන් සඳහා පහත සඳහන් දිස්ත්‍රික්කවලදී ප්‍රායෝගික පරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටවනු ලැබේ.

**කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, මාතලේ, මහනුවර, නුවරඑළිය, බදුල්ල, මොනරාගල, අම්පාර**

03. 65 - ඉංජිනේරු තාක්ෂණවේදය හා 66 - ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයයන් සඳහා ඉල්ලුම් කිරීමට තිබිය යුතු සුදුසුකම් පහත දැක්වේ. මෙම විෂයයන්හි ප්‍රායෝගික පරීක්ෂණ දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම පවත්වනු ලැබේ.

3.1 65 - **ඉංජිනේරු තාක්ෂණවේදය ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අයදුම් කරන ගුරු භවතුන් සඳහා තිබිය යුතු සුදුසුකම්**

- නිර්මාණකරණය හා තාක්ෂණවේදය විෂය සඳහා පත්වීම් ලද ගුරු භවතකු වීම හෝ
- ඉංජිනේරු තාක්ෂණවේදය විෂය උගන්වන ගුරු භවතකු වීම හෝ
- ඉහත විෂයන්ට අදාල ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී සහ තාක්ෂණ පුහුණු ගුරු භවතුන් වීම.

3.2 66 - **ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය සඳහා අයදුම් කරන ගුරුභවතුන් සඳහා තිබිය යුතු සුදුසුකම්**

- ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය සඳහා පත්වීම් ලද ගුරු භවතකු වීම.
- විද්‍යාවේදී විශේෂ උපාධිය (කෘෂි විද්‍යා) සහිත ගුරු භවතකු වීම හෝ
- විද්‍යාවේදී උපාධිය (ජෛවීය විද්‍යා) උපාධිධාරී ගුරු භවතකු වීම.

04. තමන් පදිංචි දිස්ත්‍රික්කය, සේවය කරන දිස්ත්‍රික්ක සහ පසුගිය වසරේ සේවය කරන ලද දිස්ත්‍රික්කය හැර වෙනත් දිස්ත්‍රික්කයක් ඉල්ලුම් කළ යුතුය. මෙම ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සඳහා පරීක්ෂකවරයකු හෝ පරීක්ෂකවරියක වශයෙන් තෝරාගනු ලැබුවහොත් පත්කරනු ලබන ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමට සුදානම් විය යුතුය.

05. ඉල්ලුම් පත්‍රයේ ඇතුළත් කර ඇති කාලසටහන නිවැරදි බවට විදුහල්පති විසින් පෞද්ගලිකව ම පරීක්ෂා කර බලා සහතික කළ යුතු වේ. මීට පෙර අවස්ථාවල ගුරු භවතුන් විසින් ඉල්ලුම්පත්‍රවල ව්‍යාජ තොරතුරු ඇතුළත් කර ඇති බව අනාවරණය වී ඇත. එබැවින් එවැනි අසත්‍ය හෝ ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් සහතික කරන නිලධාරියා ලෙස ඔබ ද මේ පිළිබඳව වගකීම දැරිය යුතු බව කාරුණිකව දන්වමි. තවද සහතික කිරීමේ බලය වෙනත් කෙනෙකුට නොපැවරිය යුතු බව ද වැඩිදුරටත් දන්වමි.

ලිපිනය : **විභාග කොමසාරිස් ජනරාල්**
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

**(ලිපිනය ලියු කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි "2024 අ.පො.ස (උ.පෙළ) ප්‍රායෝගික පරීක්ෂණ" යනුවෙන් සඳහන් කරන්න.)**

එච්.ජේ.එම්.සී අමිත් ජයසුන්දර

විභාග කොමසාරිස් ජනරාල්

පිටපත් : සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු. අ.ක.ස

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු. අ.ක.ස

ඇමුණුම 01

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව

## අ.පො.ස (උ.පෙළ) විභාගයේ - 2024 ප්‍රායෝගික පරීක්ෂණ පරීක්ෂකවරුන් තෝරා ගැනීමේ අයදුම්පත්‍රය මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

01. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඔබ විසින් සත්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කළ හොත් දීර්ඝ කාලීනව විභාග රාජකාරි තහනමකට ලක් කිරීමට ඉඩ ඇත.

02. ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම් කරන නිලධාරියෙකුගේ පවුලේ සාමාජිකයකු,පදිංචි නිවසේ සිටින නේවාසිකයකු උක්ත විභාගයේ එම ප්‍රායෝගික පරීක්ෂණ විෂය සඳහා පෙනී සිටින්නේ නම් එවැනි නිලධාරියකු මෙම පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම් නොකළ යුතුයි.

03. යම් නිලධාරියකු එම ප්‍රායෝගික විෂය සඳහා ප්‍රසිද්ධ උපකාරක පන්ති පවත්වන්නේ නම් ඔහු / ඇය පරීක්ෂණ මණ්ඩලයේ තනතුරක් දැරීමට සුදුසු නොවන හෙයින් අයදුම් නොකළ යුතුයි. ප්‍රායෝගික පරීක්ෂණය මණ්ඩල සඳහා අයදුම් පත් යොමු කළ හැකි වනුයේ රජයේ හෝ රජයේ අනුමත පෞද්ගලික පාසලක ස්ථිර ගුරුවරයෙකුට පමණි.

04. මාර්ගගතව අයදුම් කිරීමට පහත දැක්වෙන ඕනෑම ක්‍රමයක් අනුගමනය කළ හැක.

අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ,

- නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "EXAM INFORMATION CENTER" මත (click) කර ඉන්පසු " G.C.E.(A/L) Examination 2024 Obtaining Information to select Examiners for the Practical Test" මත (click) කිරීම මගින් හෝ
- නිල ජංගම දුරකථන යෙදවුම (mobile application) වන "DOE" වෙත පිවිස "EXAM INFORMATION CENTER" මත (click) කර ඉන්පසු " G.C.E.(A/L) Examination 2024 Obtaining Information to select Examiners for the Practical Test" මත (click) කිරීම මගින් හෝ
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසීමෙන්

ලැබෙන ප්‍රවේශ කවුළුවේ, "Personal Account Login" හරහා පද්ධතියට ප්‍රවේශ වන්න.

05. එහි තරු (*) ලකුණින් දක්වා ඇති කොටස් අනිවාර්යයෙන්ම සම්පූර්ණ කළ යුතු අතර අනෙකුත් කොටස් ද තමන්ට අදාළ වන පරිදි සම්පූර්ණ කළ යුතුය.

06. මාර්ගගත ආකාරයට අයදුම් පත්‍රයේ පළමු පිටුව සම්පූර්ණ කිරීමේදී, තම ජංගම දුරකථන අංකයට අතිරේකව whatsApp අංකයක් හා ස්ථාවර දුරකථන අංකයක් ( ඇත්නම්) ඇතුළත් කරන්න. නොමැති නම් ඔබගේ වෙනත් ජංගම දුරකථන අංකයක් ඇතුලත් කරන්න.

07. වෙබ් පිටු අතර මාරුවීමට "Back"හෝ "Next" අයිකනය භාවිතා කරන්න. ඔබ ඉල්ලා සිටින දිස්ත්‍රික්කවලට අමතරව දිවයිනේ වෙනත් ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමට කැමති ද නැද්ද යන්න පිළිබඳව මනා අවබෝධයකින් යුතුව සම්පූර්ණ කරන්න.

08. අයදුම්පත්‍රයේ සියලුම කොටස් සම්පූර්ණ කර "Submit" අයිකනය (click) කිරීමෙන් පසු ඔබගේ අයදුම්පත්‍රය PDF ආකාරයට බාගත (Download) කර ගත හැකි වේ. එම අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතක් (printout) ඔබ විසින් ලබා ගත යුතුය. "Submit". නොවීමට ප්‍රධානතම හේතුව ඔබ විසින් තරු (*) ලකුණින් දක්වා ඇති කොටස් නිසි පරිදි සම්පූර්ණ නොකිරීම නිසා විය හැකි බැවින් නැවත පෙර පිටු පරීක්ෂා කර බලන්න.

09. එම මුද්‍රිත පිටපතේ අංක 13 කොටස (කාලසටහන) අත් අකුරින් සම්පූර්ණ කර ආයතන ප්‍රධානියා / විදුහල්පතිවරයා මඟින් සහතික කරවා ගෙන ඔහුට / ඇයට භාර දිය යුතුය.

10. ඔබ ප්‍රධාන හෝ සහකාර පරීක්ෂකවවරයෙකු ලෙස මින් පෙර කටයුතු කර ඇත්නම් සේවය කර ඇති වසර ගණන අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය. එසේ නොකිරීමෙන් පමීක්ෂකවරු තෝරා ගැනීමේ දී ඔබට අවාසිදායක විය හැකිය.

**11. නියමිත පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

12. අදාළ ආයතනයේ ප්‍රධානියා / විදුහල්පතිවරයා විසින් අංක 15 කොටස සම්පූර්ණ කිරීමෙන් පසු අයදුම්පත්‍ර සියල්ල එකම කවරයක බහා 2024/11/30 දිනට ප්‍රථම පහත ලිපිනයට යොමු කරන්න.

විභාග කොමසාරිස් ජනරාල්,
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

13. ලිපිනය ලියූ කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි **"2024 අ.පො.ස ( උ.පෙළ) ප්‍රායෝගික පරීක්ෂණ"** යනුවෙන් සඳහන් කරන්න.

14. ඔබට අමතර වශයෙන් උපදෙස් අවශ්‍ය වුවහොත් පහත දුරකථන අංක මගින් **පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව** අමතන්න.

දුරකථන අංක : **0112784208/0112784537**